# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1906/44 - 2015 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2015.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිවල ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවල 23 වැනි අතුරු ව්‍යවස්ථාව පරිදි සකස් කරන ලද නියෝග

වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවල 23 වැනි අතුරු ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් දිසානායක මුදියන්සේලාගේ කුලමිණි චන්දන දිසානායක වන මම වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නියෝග මෙයින් පනවමි.

ඩී. එම්. කේ. සී. දිසානායක,<br>
සමුපකාර සංවර්ධන කොමසාරිස්<br>
සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (වයඹ).

2015ක් වූ පෙබරවාරි මස 25 වැනි දින,<br>
කුරුණෑගල දී ය.

1. **කෙටි නාමය**

මෙම නියෝගයන්ට "වයඹ පළාතේ විවිධ සේවා සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සභා තෝරා පත් කර ගැනීමේ නියෝග" යයි කියනු ලැබේ.

2. **ඡන්දහිමි සාමාජික නාමලේඛනය :-**

2.1 විවිධ සේවා සමුපකාර සමිතියක ලියාපදිංචි කරන ලද අතුරු ව්‍යවස්ථාවේ 22(1) වෙනි අතුරු ව්‍යවස්ථාව පරිදි තෝරා පත් කර ගත යුතු කාරක සභිකයින් ප්‍රමාණය තෝරා ගැනීම සඳහා ඡන්දය දීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ, ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට වසා දමන ලද සාමාජික නාමලේඛනයක් රීතිවලින් නියම කර ඇති ආකාරයට එලඹෙන වර්ෂයේ ජනවාරි මස 15 දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිටපත් 3 බැගින් සකස් කළ යුතු අතර එයින් එක පිටපතක් සමිති ප්‍රධාන කාර්යාලයෙහි ප්‍රසිද්ධ ස්ථානයක ද තවත් පිටපතක් ප්‍රාදේශිකයේ හෝ ප්‍රාදේශිකයක් නොමැති අවස්ථාවකදී ප්‍රාදේශික බල ප්‍රදේශයේ සමිතියේ ව්‍යාපාර කටයුතු කරන වෙනත් ස්ථානයක ද හෝ ජනවාරි මස 16 දින සිට 31 දින දක්වා ප්‍රදර්ශනය කළ යුතු වේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේ වුවද යම් සමුපකාර සමිතියක නිලවරණය පැවැත්විය යුතු දිනට මාස තුනකට පෙර මාසයේ අවසන් දිනට පියවන ලද සාමාජික නාමලේඛනය එළඹෙන මාසයේ 15 දිනට පෙර සකස් කළ යුතු අතර එම සාමාජික නාමලේඛනය එම මාසයේ 16 දින සිට එම මාසයේ අවසන් දින දක්වා එසේ ප්‍රදර්ශනය කළ යුතු ය. ඉදිරිපත් වන විරෝධතා පිළිබඳ සංශෝධන, එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර කළ යුතුය.

2.2 ඉහත 2.1 නියෝගයෙහි සඳහන් සාමාජික නාමලේඛනයේ නම ඇතුළත්වීමට සුදුසුකම් ඇති යම්කිසිවකුගේ නම එසේ ඇතුළත්වී නැත්නම් එය ඇතුලත් කර ගැනීම සඳහා ඒ සාමාජික නාමලේඛනය ප්‍රදර්ශනය කළ 16 දින සිට එම මාසයේ අවසන් දින දක්වා සමිතියේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඔහුට හෝ ඇයට හැකිය. එවැනි අභියාචනා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සලකා බලා යම් සංශෝධන අවශ්‍ය වන්නේ නම් එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර එම සංශෝධන සාමාජික නාමලේඛනයට ඇතුලත් කළ යුතු වේ.

2.3 ඉහත 2.1 නියෝගයෙහි සඳහන් සාමාජික නාමලේඛනයේ නම ලියාපදිංචි වී ඇත්තා වූ ඕනෑම සාමාජිකයෙකුට සාමාජික නාමලේඛනයෙහි යම්කිසිවකුගේ නමක් ඇතුලත් කිරීම ගැන සමිතියේ ලේකම් වෙත ලිඛිතව විරුද්ධත්වය ප්‍රකාශ කළ හැකි අතර එම විරුද්ධත්වය සම්බන්ධයෙන් හේතු ද එම ලිපියේ සඳහන් විය යුතු වේ. මෙවැනි විරුද්ධත්වයක් ප්‍රකාශ කළ හැක්කේ එම සාමාජික නාමලේඛනය ප්‍රදර්ශනය කළ 16 දින සිට එම මාසයේ අවසන් දින හෝ ඊට ප්‍රථමයෙන්ය. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එවැනි විරුද්ධත්වයන් ද සලකා බැලිය යුතු අතර යම් සංශෝධනයක් අවශ්‍ය නම් එම සංශෝධන එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර කල යුතු වේ.

2.4 2.2 නියෝගයේ සඳහන් අභියාචනා ද 2.3 නියෝගයේ සඳහන් විරුද්ධතාවයන් ද ගැන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමිත කාල සීමාව ඇතුලත ක්‍රියා නොකළහොත් එවැනි අභියාචනයන් සහ විරුද්ධත්වයන් ගැන කරුණු පරීක්ෂා කර අවශ්‍ය වුවහොත් සාමාජික නාමලේඛනය නිසි පරිදි සංශෝධනය කරන ලෙස සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ට සමිතිය වෙත ලිඛිත නියෝගයක් කළ හැකිය. එවිට ඒ අනුව සමිතිය ක්‍රියා කල යුතුය. සංශෝධිත සාමාජික නාමලේඛනය සමිතියේ ලේකම් විසින් එළඹෙන මාසයේ අවසන් දින හෝ ඊට පෙර පිළියෙල කළ යුතු අතර සමිතියේ සභාපති හා අධ්‍යක්ෂවරයෙකු විසින් නිවැරදි බවට සහතික කළ යුතු වේ.

2.5 නිලවරණයක් පැවැත්වෙන සෑම අවස්ථාවකදීම සෑම ප්‍රාදේශිකයක් සඳහාම 2.4 අනුව සහතික කරන ලද සාමාජික නාමලේඛනයේ පිටපත් තුනක් දින හතක් ඇතුලත සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු අතර සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් සහතික කරන ලද පිටපත් දෙකක් සමිතිය වෙත ලබාදිය යුතුය. එම සාමාජික නාමලේඛනය අනුව ඡන්දය පැවැත්විය යුතුය.

2.6 නියෝග 2.1 යටතේ සඳහන් කරන සාමාජික නාමලේඛනය සමිතිය විසින් සකස් නොකරන ලද නම් හෝ නියෝග 2.2 හා 2.3 යටතේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සංශෝධනය නොකරන ලද නම් හෝ නියෝග 2.4 යටතේ සහතික නොකරන ලද නම් හෝ නියෝග 2.5 යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් නොකරන ලද නම් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් වෙනත් නිලධාරියකු මගින් සාමාජික නාමලේඛනය සකස් කරවීම හෝ අදාල වන වෙනත් යම් නියෝගයක් කිරීම කළ හැකිය. එවිට ඒ සාමාජික නාමලේඛනය අනුව ඡන්දය පැවැත්වීම නීත්‍යානුකුල විය යුතුය. සමිති අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම පැහැර හැරීම නිසා යම් මුදලක් දැරීමට සිදු වූයේ නම් එම වටිනාකම් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අය කර ගැනීමට සමුපකාර සමිති පනතේ 66(1) වගන්තිය යටතේ නියෝග කිරීම නීත්‍යානුකුල විය යුතු ය.

## සාමාන්‍ය කරුණු

### ප්‍රධාන ඡන්ද නිලධාරි, කලාපභාර ඡන්ද නිලධාරීන් හා සහකාර ඡන්ද නිලධාරින් පත් කිරීම

3.1 කොමසාරිස්තුමා විසින් සෑම විවිධ සේවා සමුපකාර සමිතියක් සඳහාම මෙම නියෝග මාලාව යටතේ ප්‍රධාන ඡන්ද නිලධාරියකු හා අවශ්‍ය ප්‍රමාණයට කලාපභාර ඡන්ද නිලධාරින් සහ සහකාර ඡන්ද නිලධාරින්ද පත් කළ යුතුය. එවැනි පත් කිරීම් මෙහි පහත "අ" උපලේඛනය පරිදි විය යුතුයි.

3.2 එසේ කොමසාරිස්තුමා විසින් පත් කරනු ලබන ඡන්ද නිලධාරින්ට මෙම නියෝග මාලාව යටතේ කොමසාරිස්තුමාට පමණක් භාවිතා කළ හැකි බලතල හැර අනෙකුත් සියළු බලතල භාවිතා කළ හැකිය.

3.3 තම සමිතියේ නිලවරණ පැවැත්විය යුතු ප්‍රාදේශික පිළිබඳ විස්තර සමිතියේ ලේකම් විසින් මහා සභාවේ නිල කාලය අවසන්වීමට මාස තුනකට කලින් කොමසාරිස්තුමා වෙත දැනුම්දිය යුතු අතර කොමසාරිස්තුමා විසින් නාමයෝජනා පත්‍ර බාර ගැනීමේ හා ඡන්ද විමසීමේ දිනයන් කල් තබා නියම කළ යුතුය. එවැනි දිනයන් වෙනස් කිරීමේ බලයද ඔහු සතු වේ.

3.4 නාමයෝජනා පත් භාරගත් අවස්ථාවේ සිට ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන අවස්ථාව දක්වා ඡන්දය නිසියාකාරයෙන් පැවැත්වීම සම්බන්ධව ප්‍රධාන ඡන්ද නිලධාරී, කලාපභාර ඡන්ද නිලධාරීන් සහ සහකාර ඡන්ද නිලධාරින් වගකිව යුතුය. මෙම නියෝග මාලාවේ නියෝග 8.1 හා 13.2 යටතේ ඡන්ද ප්‍රතිඵල සමිතියට දැන්විය යුතු අතර සෑම අවස්ථාවකදීම කොමසාරිස්තුමාගේ උපදෙස් පිළිපැදිය යුතුය.

3.5 නාමයෝජනා පත් හා ඒවාට ඇති විරුද්ධතාවයන් භාරගන්නා දිනය වේලාව හා ස්ථානය සඳහන් නිවේදන ඡන්ද නිලධාරි තැන විසින් අඩු වශයෙන් දින 7කට වත් කලින් සමිතියේ ලේකම් තැන වෙත දැනුම් දිය යුතුය.

3.6 ඒ සමගම ඡන්ද නිලධාරි තැන විසින් එකී නිවේදනයේ සෑහෙන පිටපත් සංඛ්‍යාවක් සමිති ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශිකයේ, ප්‍රාදේශික බල ප්‍රදේශ තුළ හා අනෙකුත් වැදගත් ස්ථානවල ප්‍රදර්ශනය කිරීම සඳහා සමිතියේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර එකී නිවේදන ප්‍රදර්ශනය කිරීමේ වගකීම සමිතියේ ලේකම් දැරිය යුතුය.

3.7 ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් ප්‍රාදේශික කාරක සභාව සඳහා ඡන්දය පැවැත්වෙන ස්ථානය සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු අතර නියෝග 2.5 හෝ 2.6 අනුව සහතික කරන ලද අවසාන ඡන්ද හිමි සාමාජික නාමලේඛනය අනුව ඡන්දය පැවැත්විය යුතුය.

3.8 මෙම නියෝග මාලාව යටතේ ඡන්ද විමසීමේදී ඡන්ද නිලධාරීන්ට/කලාපභාර ඡන්ද නිලධාරීන්ට/ සහකාර ඡන්ද නිලධාරින්ට අවශ්‍ය විය හැකි සෑම සහායක්ම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා එම සමිතියේ කාර්යය මණ්ඩලය විසින් නොඅඩුව දිය යුතුය.

## දෙවන කොටස

### නුසුදුසුකම්

4.1 පහත සඳහන් සාමාජිකයින් ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත් කිරීම, තෝරාපත් කිරීමට නාමයෝජනා කිරීම හෝ නාම යෝජනා ස්ථිර කිරීම කළ නොහැකිය.

(අ) එම ප්‍රාදේශිකයෙහි ඡන්දහිමි සාමාජික නාමලේඛනයෙහි නම සඳහන් වී නැති කෙනෙක්,

(ආ) වයස අවුරුදු 18ට අඩු කෙනෙක්,

(ඇ) පසුගිය තුන් වර්ෂය තුළ අපරාධ වරදක් සම්බන්ධ නඩුවකින් වරදකරුවෙකු වූ කෙනෙක් හෝ කුමන ආකාරයකින් හෝ තුන් මසකට අධික කාලයක් සිර දඬුවමක් ලැබීමට නියම වූ කෙනෙක් හෝ එකී දඬුවම අත්හිටවනු ලැබූ කෙනෙක්,

(ඈ) බංකොලොත් වීමට ඉල්ලා තිබෙන කෙනෙක් හෝ බංකොලොත්කාරයෙකු වශයෙන් උසාවිය පිළිගත් කෙනෙක්,

(ඉ) මේ සමිතියෙන් හෝ ලියාපදිංචි කළ වෙනත් සමුපකාර සමිතියකින් හෝ ලබාගත් ණයක් හෝ සමුපකාර නීතියේ 44(6) වගන්තිය යටතේ අධිභාරයක් හෝ 66 වගන්තිය යටතේ නියෝගයක් අනුව හෝ ගෙවිය යුතු වෙනයම් මුදලක් හෝ ගෙවිය යුතු යම් වාරික මුදලක් හෝ ආපසු ගෙවීම මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් පැහැර හැර තිබෙන කෙනෙක්,

(ඊ) වෙළෙන්දෙකු වශයෙන් සමිතියේ දියුණුවට බාධාවන යම් ව්‍යාපාරයක යෙදී සිටින කෙනෙක්,

(උ) සමිතියෙන් ආදායමක් හෝ ලාභයක් ලැබෙන නිලයක් හෝ තනතුරක් හෝ උසුලන කෙනෙක් හෝ කොමසාරිස්තුමාගේ පූර්ව අනුමැතිය නොමැතිව සමිතියෙන් පාරිතෝෂික මුදලක් ලබන කෙනෙක්,

(ඌ) මෙම සමිතියේ හෝ වෙනත් ලියාපදිංචි කල සමුපකාර සමිතියක හෝ වැටුප් ලබන සේවකයෙක්,

(එ) සමිතිය සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමක් හෝ සමිතිය යම් විකිණීමක් හෝ මිලයට ගැනීමක් හෝ සමිතියේ මුදල් සම්බන්ධයෙන් එවකට ඇතිකරගෙන තිබෙන්නාවූ ද, ඇතිකර ගැනීමට විධිවිධාන සලස්වා ගෙන යන්නා වූද, ගිවිසුමක් හෝ ගනුදෙනුවක් පිළිබඳව සාමාජිකයෙකු වශයෙන් හැර තමන්ගේ හෝ අන්කිසි අයෙකුගේ මාර්ගයෙන් හෝ සම්බන්ධයක් ඇති කෙනෙක්,

(ඒ) සමුපකාර නීතිය යටතේ, පසුගිය 5 වර්ෂය ඇතුළත තම නිලයෙන් හෝ සේවයෙන් පහ කරනු ලැබූ කෙනෙක්,

(ඔ) සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශික කාරක සභාව විසින් හෝ සලකා බලනු නොලැබූ කෙනෙක් හෝ අධ්‍යක්‍ෂක මණ්ඩලයට ආයාචනයක් ඉදිරිපත් කරන ලද හෝ සමුපකාර නීතියේ 60(2) වගන්තිය යටතේ කොමසාරිස්තුමා විසින් තීරණය කරන ලද හෝ මෙම රීති මාලාවේ 2.4 හෝ 2.6 යටතේ හෝ ඡන්ද ලේඛනයේ නම ඇතුලත් නොමැති කෙනෙක්,

(ඕ) නාමයෝජනා භාරගන්නා දිනට පෙරාතුවම වූ වසර 01ට නොඅඩු කාලයක් තම ප්‍රාදේශික මහ සභා බල ප්‍රදේශයේ සමිතිය විසින් කිසිඳු ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන නොගිය ප්‍රාදේශිකයක සාමාජිකයකු වන යම් කෙනෙක් එසේ වුවද සමිතියේ ආසන්නතම මහ සභාවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු නොවූ තැනැත්තෙකුට මෙම විධිවිධානය අදාල නොවිය යුතුය,

(ඖ) නාමයෝජනා පත්‍ර භාර ගැනීමට නියමිත දිනයට පෙර සාමාජිකත්වය නැති වූ කෙනෙක්,

(ක) සමුපාර නීතියේ 58 වන වගන්තිය යටතේ තීරක ප්‍රදානයක් හෝ 44(6) වන වගන්තිය යටතේ අධිභාරයක් හෝ 66 වන වගන්තිය යටතේ නියෝගයක් හෝ කරනු ලැබ ඇති විටක, එකී තීරක ප්‍රදානයේ, අධිභාරයේ හෝ නියෝගයේ සඳහන් වටිනාකම සම්පූර්ණයෙන් ආපසු ගෙවා අවසන් කර වසර තුනක කාලයක් ඉකුත් වී නැති කෙනෙක්,

### නාමයෝජනා

5.1 නාමයෝජනා පත්‍ර - ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත්වීමට ඉදිරිපත් වන සෑම ඡන්ද අපේක්‍ෂකයාගේම නම සමිතියේ සාමාජිකයෙකු විසින් යෝජනා කර තවත් සාමාජිකයෙකු විසින් ස්ථිර කළ යුතුය. සියළුම ඡන්ද අපේක්‍ෂකයන්ම ඔවුන්ගේ නම් යෝජනා කරන අයද ඒවා ස්ථිර කරන අයද ඡන්ද විමසීම පවත්වන ප්‍රාදේශිකයේ ඡන්දදායක ලැයිස්තුවෙහි නම සඳහන් වී ඇති සාමාජිකයින් විය යුතුය. ඡන්ද අපේක්‍ෂකයින්ගේ නම් යෝජනා කිරීම හා ස්ථිර කිරීම මේ නියෝග මාලාවෙහි "ආ" උපලේඛනයෙහි නියමිත ආකෘති පත්‍රයෙහි ලියවිල්ලකින් කල යුතුය.

### ඡන්ද අපේක්‍ෂක යෝජනාකරු හා ස්ථිරකරුගේ ප්‍රකාශනය

5.2 සෑම ඡන්ද අපේක්‍ෂකයාම මේ නියෝග මාලාවේ "ඇ" උපලේඛනයේ නියමිත ආකෘති පත්‍රයෙහි ප්‍රකාශනයක් තම නාමයෝජනා පත්‍රවලට ඇමිණිය යුතුයි.

5.3 යෝජනාකරු හා ස්ථිරකරු විසින්ද ඡන්ද අපේක්‍ෂක මෙන්ම මෙම නියෝග මාලාවේ උපලේඛන "ඇ1" අනුව ප්‍රකාශනයක් කළ යුතුය.

### නාමයෝජනා පත්‍ර භාරගැනීම

6.1 ප්‍රාදේශික කාරක සභාවක් තෝරා ගැනීම සඳහා නාමයෝජනා පත්‍ර භාරගැනීමට නියම කල දින නියමිත වේලාවට නියමිත ස්ථානයට ඡන්ද නිලධාරින්/කලාපභාර ඡන්ද නිලධාරින්/ සහකාර ඡන්ද නිලධාරි පැමිණ සිටිය යුතු අතර භාර දෙනු ලබන නාමයෝජනා පත්‍ර භාරගත යුතුය.

6.2 සෑම නාමයෝජනා පත්‍රයක්ම පිටපත් 4කින් සකස් කළ යුතු අතර ඒ සඳහා උපලේඛන "ආ" පාවිච්චි කළ යුතුය. නාමයෝජනා පත්‍රය යෝජනාකරු හා ස්ථිරකරු විසින්ද ඡන්ද අපේක්‍ෂකයා විසින්ද අත්සන් කර තිබිය යුතු අතර එය "ඇ" හා "ඇ1" ප්‍රකාශයන්ද සමග නාමයෝජනා පත්‍ර භාරගැනීමට නියමිත දින පෙ. ව. 9.00-10.00 දක්වා කාලය තුළ අපේක්‍ෂකයා විසින්ම හෝ යෝජනාකරු හෝ ස්ථිරකරු විසින්ම ඡන්ද නිලධාරි තැනට/කලාපභාර ඡන්ද නිලධාරි තැනට/ සහකාර ඡන්ද නිලධාරි තැනට භාරදිය යුතුය.

6.3 එසේ භාරගනු ලබන නාමයෝජනා පත් ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/ සහකාර ඡන්ද නිලධාරි විසින් පරීක්‍ෂා කර බලා ඡන්ද අපේක්‍ෂක, යෝජනාකරු හා ස්ථිරකරු නියෝග මාලාවේ 4.1 ඡේදය අනුව නුසුදුස්සන් වේ නම් හා හෝ ඡන්ද හිමි සාමාජික නාමලේඛනයේ නම ඇතුලත් වී නැති කෙනෙකු වන්නේ නම් හා හෝ ඔවුන්ගෙන් යම් කෙනෙකු නාමයෝජනා පත් භාරදෙනු නොලැබුයේ නම් හෝ නියෝග මාලාවේ 5.1 හෝ 5.2 හෝ 5.3 ඡේදය අනුව නාමයෝජනා පත් අසම්පූර්ණ වේ නම් හා හෝ එම නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කළ යුතුය.

6.4 ඉන්පසු ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන ඉහත 5.3 නියෝගය යටතේ තමා විසින් ප්‍රතික්‍ෂේප නොකරන ලද සෑම නාමයෝජනා පත්‍රයකම පිටපත් 2ක් නාමයෝජනා පත් භාරගත් ස්ථානයේ ප්‍රකටව ප්‍රදර්ශනය කළ යුතුය.

### විරුද්ධත්වය භාරගැනීම

7.1 ඡන්දය විමසීමට අපේක්ෂා කරන ප්‍රාදේශිකයේ ඡන්ද දායක ලැයිස්තුවේ නම සඳහන් වී ඇති ඕනෑම කෙනෙකුට ඕනෑම නාමයෝජනාවක් ගැන විරුද්ධතාවයක් ඉදිරිපත් කළ හැකිය එවැනි විරුද්ධතාවයක් ලිඛිතව කළ යුතුය. තවද එවැනි විරුද්ධත්ව නාමයෝජනා පත් භාරගන්නා දින පෙ. ව. 10.00 - 11.00 දක්වා කාලය තුලදී ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් භාරගත යුතුය. ඉන් පරිබාහිරව කිසිඳු විරුද්ධතාවයක් භාර නොගත යුතු අතර, ඊට පටහැනිව භාරගෙන කරනු ලබන්නා වූ සියලු නියෝග බල රහිත විය යුතුය.

7.2 විරුද්ධතාවයක් ඉදිරිපත් කල හැක්කේ පහත සඳහන් කරුණු නිසා පමණක්මය :-

(අ) නාමයෝජනාකරුද, ස්ථිරකරුද, ඡන්ද අපේක්‍ෂකයා ද යන අයගෙන් කවරෙකු හෝ ඉහත 4.1 වෙනි නියෝගයේ විධිවිධාන එකක් හෝ වැඩි ගණනක් යටතේ නුසුදුසුවීම.

(ආ) ඡන්ද අපේක්‍ෂක හෝ නාමයෝජනාකරු හෝ ස්ථිරකරු හෝ ඡන්දදායක ලැයිස්තුවේ නම ඇතුළත් වී නැති කෙනෙක් වීම.

(ඇ) ඡන්ද අපේක්‍ෂක හෝ නාමයෝජනා හෝ ස්ථිරකරු හෝ විසින් නාමයෝජනා පත්‍රය භාර නොදීම.

7.3 7.2(ආ) සහ (ඇ) යටතේ ඉදිරිපත් කරන ලද විරුද්ධතාවයක් ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන පිළිගත් විට ඒ විරුද්ධත්වයට අදාල නාමයෝජනා පත්‍රය ඔහු විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

7.4 7.2(ආ) සහ (ඇ) නියෝගය යටතේ විරුද්ධත්ව කෙසේ වෙතත් ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන තමා භාරගත් නාමයෝජනා පත්‍ර අනුව ඡන්ද විමසීම පැවැත්වීමට ක්‍රියා කරගෙන යා යුතුය. 7.2(අ) නියෝගය යටතේ සියළුම විරුද්ධතාවයන් කොමසාරිස්තුමාට ඉදිරිපත් කළ යුතුවේ. එවිට ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමා තීරණය කල යුතු අතර කොමසාරිස්තුමාගේ තීරණය අවසාන හා තීරණාත්මක තීරණය වේ.

7.5 කොමසාරිස්තුමා විසින් 7.2(අ) නියෝගය යටතේ විරුද්ධත්වයන් පිළිගත් විට ඒ ඡන්දදායකයාගේ තෝරා පත්වීම ඒ කරුණින්ම අවලංගු වේ. ඒ තීරණය හේතුකොට ගෙන කාරක සභාවේ ඇතිවෙන පුරප්පාඩුව සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව පිරවිය යුතුවේ.

### ජර්නලය

7.6 ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/ සහකාර ඡන්ද නිලධාරි විසින් කොටස් 2කින් යුතු ජර්නලයක් පාවිච්චි කළ යුතුය. ඉන් එක් පිටපතක් අදාල සමිතිය වෙත භාරදිය යුතු අතර අනෙක් පිටපත ප්‍රදේශය භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. නියෝග 7.2"අ" අනුව ලිඛිතව ඉදිරිපත් කරන ලද විරුද්ධතාවයන් ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තැන වෙත ඉදිරිපත් කළ යුතුය. නියෝග 7.2(ආ) සහ (ඇ) අනුව ලිඛිතව ඉදිරිපත් කරන ලද විරුද්ධතාවයන්ද ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් ප්‍රදේශ භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත භාරදිය යුතුය.

ජර්නලයේ ප්‍රථම කොටසේ පහත කරුණු සඳහන් කළ යුතුය :

(අ) සමිතියේ නම හා ලිපිනය,

(ආ) ප්‍රාදේශික අංකය හා ලිපිනය,

(ඇ) නාමයෝජනා භාරදුන් අපේක්ෂකයින්ගේ නම් හා ඒවා භාරදුන් වේලාවන්,

(ඈ) නියෝග 7.1 යටතේ විරුද්ධතාවයන් ඉදිරිපත් කළ අයවළුන්ගේ නම් ලිපිනයන් හා ඒවා භාරදුන් වේලාවන්.

(ඉ) නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කරන ලද අපේක්‍ෂකයන්ගේ නම් හා ප්‍රතික්ෂේප කිරීමට හේතු,

(ඊ) නියෝග 7.2(අ) හා 7.2(ආ)(ඇ) යටතේ විරුද්ධතාවයන්ට ලක්වූ අපේක්ෂකයින්ගේ නම් වෙන් වෙන්ව සඳහන් කිරීම,

(උ) නියෝග 9.2 යටතේ ඡන්ද අපේක්‍ෂකයන්ට වෙන්කර දුන් සංකේත අංක.

7.7 ජර්නලයේ 2 වන කොටසේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුයි :-

(අ) ඡන්ද මධ්‍යස්ථානය,

(ආ) ඡන්දය ආරම්භ කළ දිනය හා වේලාව,

(ඇ) ඡන්ද විමසීම අවසන් කළ දිනය හා වේලාව,

(ඈ) ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් පාවිච්චි කළ මුද්‍රාවේ සලකුණ හා ආදර්ශ අත්සන.

(ඉ) පහත සඳහන් කරුණු ඇතුලත් ඡන්ද පත්‍රිකා ගිණුම.

(ඊ) ඡන්ද විමසීම ආරම්භ කිරීමට පෙර ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි වෙත තිබූ ඡන්ද පත්‍රිකා ගණන ............................

1. නරක්වූ ඡන්ද පත්‍රිකා හැර ඡන්දදායකයන් වෙත නිකුත් කළ ඡන්ද පත්‍රිකා ගණන ... ... ............................
2. නරක්වූ ඡන්ද පත්‍රිකා ගණන ... ... ............................
3. පාවිච්චි නොකරන ලද ඡන්ද පත්‍රිකා ගණන ... ............................

එකතුව

(උ) එක් එක් අපේක්ෂකයා ලැබූ ඡන්ද සංඛ්‍යාව

1. ............................
2. ............................
3. ............................
4. ............................
5. ............................
6. ............................
7. ............................
8. ............................
9. ............................

............................
............................
............................

මුළු එකතුව

(ඌ) මෙම නියෝග මාලාවේ 8.2 හා8.1 අනුව තෝරාපත් කරගන්නා ලද අපේක්ෂකයන්ගේ නම් :-

## තෙවන කොටස

## ඡන්ද ක්‍රියා පිළිවෙල

8.1 **නිතරඟ ඡන්ද විමසීම**

නිසි පරිදි නාමයෝජනා කරනු ලැබූ ඡන්ද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව 9ක් හෝ ඊට අඩු ගණනක් සහ 5ක් හෝ ඊට වැඩි ගණනක් වුවහොත් එවැනි සෑම ඡන්ද අපේක්ෂකයාම තෝරාපත් වූ ලෙස සලකුණු ලැබේ. එවිට ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන ඒ බවට ලිඛිත ප්‍රකාශනයක් සමිතියේ ලේකම් තැනට නිකුත් කළ යුතුවේ.

8.2 **කාරක සභික ඡන්ද විමසීම**

නිසි පරිදි නාමයෝජනා කරන ලද ඡන්ද අපේක්ෂකයන්ගේ සංඛ්‍යාව 9කට වැඩි වූ විට ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන විසින් ඔවුන්ගේ නම් ඔවුනට වෙන් කර දුන් ඡන්ද සංකේත අංකය, ඡන්දය පවත්වන දිනය, වේලාව හා ස්ථානය පිළිබඳ සමිතියට ලිඛිතව දැනුම් දිය යුතුය. අනතුරුව සමිතිය විසින් ඡන්ද දැන්වීම් සකස් කර මුද්‍රණය කර ප්‍රචාරණය කළ යුතු අතර ඡන්ද පත්‍රිකාද මුද්‍රණය කර ඡන්ද නිලධාරිට/සහකාර ඡන්ද නිලධාරිට භාර දිය යුතුය.

8.3 ඡන්ද විමසීම නියමිත දින පෙරවරු 9.00ට ආරම්භ කර පස්වරු 4.00ට අවසන් වන බව ඡන්ද විමසීම භාර ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි තැන නිවේදනය කල යුතුය.

8.4 මෙම නියෝග මාලාවේ නියෝග 11.2 අනුව සහකාර ඡන්ද නිලධාරි තැන විසින් නිකුත් කරනු ලබන මුද්‍රාව සහිත ඡන්ද පත්‍රිකා මගින් ඡන්ද විමසීම කළ යුතුය.

**ඡන්ද අපේක්ෂකයන්ට ඡන්ද සංකේත අංක වෙන්කර දීම**

9.1 ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන, ඡන්ද අපේක්ෂකයන්ගේ ගණන හා සමාන වූ සංකේත අංක ගණනක් පාවිච්චි කළ යුතුය. ඡන්ද පත්‍රිකාවේ මුද්‍රිත අංක 1 දරන සංකේත අංක සිට අනුක්‍රමික පිළිවෙලට ඇති සංකේත අංක ගණන මේ සඳහා තෝරාගත යුතුය.

*උදා.*- ඡන්ද අපේක්ෂකයන් 15 දෙනෙක් ඇත්නම් 1 සිට 15 දක්වා සංකේත අංක තෝරාගත යුතුය. ඒ සංකේත අංක අතරින් කුසපත් ඇදීමේ ක්‍රමයෙන් එක් එක් ඡන්ද අපේක්ෂකයාට එක එක සංකේත අංකයක් වෙන් කර දිය යුතුය. එක එක ඡන්ද අපේක්ෂකයාට නියම කරන ලද සංකේත අංක හා අනුක්‍රමික අංකය පිළිබඳ වාර්තාවක් ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි තැන තබා ගත යුතුය.

**ඡන්ද පත්‍රිකා**

10.1 සෑම ඡන්ද පත්‍රිකාවක්ම මේ නියෝග මාලාවෙහි "ඈ" උපලේඛනයේහි නියමිත පරිදි මුද්‍රණය කළ යුතුය.

11.1 ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන ඡන්ද විමසීමක් භාර ඡන්ද නිලධාරි තැන වශයෙන් ක්‍රියා කළ යුතුය.

11.2 ඡන්ද පත්‍රිකා නිකුත් කිරීමට පෙර ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන කිසිම අපේක්ෂකයෙකුට වෙන් කර නැති සංකේත අංක එක එක ඡන්ද පත්‍රිකාවෙන් කපා හැර පාවිච්චි කරනු ලබන එක එක ඡන්ද පත්‍රිකාවේ ප්‍රාදේශිකයේ මුද්‍රාවද තබා අත්සන් කළ යුතුය.

11.3 ඡන්ද දායක ලැයිස්තුවේ නම ඇතුලත් වී තිබෙන ඕනෑම කෙනෙකුට තම ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රයක් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් හෝ ඡායාරූප සහිත වලංගු රාජකාරි හැඳුනුම්පත හෝ විශ්‍රාමික හැඳුනුම්පත හෝ ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන වෙත හෝ ඉදිරිපත් කර ඒ මගින් තමා හඳුන්වා දුන් විට ඡන්ද පත්‍රිකාවක් ලබා ගැනීමට බලය ඇතිවේ.

11.4 ඡන්දදායකයෙකුට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර ඒ ඡන්ද දායකයාගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන් වී ඇති බවට ඡන්ද පත්‍රිකාව නිකුත් කරන තැනැත්තා සෑහීමකට පත්විය යුතුය.

11.5 එක එක ඡන්දදායකයාට ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමත් සමගම ඡන්දදායක ලැයිස්තුවෙහි ඔහුගේ නම සලකුණු කළ යුතුය.

11.6 එක ඡන්දදායකයෙකුට නිකුත් කළ හැක්කේ එක ඡන්ද පත්‍රිකාවක් පමණකි.

11.7 එක ඡන්දදායකයෙකුට තමන් කැමති එක එක ඡන්දාපේක්ෂකයාට දිය හැකි වන්නේ එක ඡන්දයක් පමණකි. තවද එක ඡන්දදායකයකු විසින් ඡන්දය දියහැකි ඡන්දාපේක්ෂකයින්ගේ උපරිම සංඛ්‍යාව 9ක් වේ. යම්කිසි ඡන්දදායකයකු ඡන්දාපේක්ෂකයන් 9 දෙනෙකුට වැඩි ගණනකට ඡන්දය දුනහොත් ඔහුගේ ඡන්ද පත්‍රිකාව ප්‍රතික්ෂේප වූ ඡන්ද පත්‍රිකාවක් ලෙස සලකණු ලැබේ.

11.8 ඡන්ද පත්‍රිකාව ලබා ගත් විට එක එක ඡන්දදායකයා තම කැමැත්ත පරිදි එහි එක එක සංකේත අංක සහ/හෝ අංකය කෙලින් ඒ ඒ කොටුවෙහි ලකුණක් තබා තම කැමැත්ත දැක්විය යුතුය. ඉන් පසු ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන ඉදිරියෙහි තබා ඇති ඡන්ද පෙට්ටියට ඒ ඡන්ද පත්‍රිකාව දැමිය යුතුය.

11.9 ශාරීරික බාධාවක් නිසා ඡන්ද පත්‍රිකාව ලකුණු කළ නොහැකි ඡන්දදායකයෙකුට තමා වෙනුවෙන් ඡන්ද පත්‍රිකා ලකුණු කරන ලෙස ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර නිලධාරි තැනගෙන් ඉල්ලා සිටිය හැකිය.

11.10 පස්වරු 4.00ට ඡන්ද නිලධාරි තැන/කලාපභාර ඡන්ද නිලධාරි තැන/සහකාර ඡන්ද නිලධාරි තැන ඡන්ද විමසීම අවසන් කල බව ප්‍රකාශ කළ යුතුවේ.

**ගණන් කිරීම**

12.1 ඡන්ද විමසීම අවසන් වූ වහාම ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි එවකට ලබා ගත හැකි සහාය ඇතිව ඡන්ද පෙට්ටියේ ඡන්ද ගණන් කිරීම ආරම්භ කළ යුතු වේ. මේ සඳහා පහත දැක්වෙන 12.2 හා 12.3 නියෝග යටතේ තමා විසින් ප්‍රතික්ෂේප කර නැති සියලුම ඡන්ද ගණන් ලකුණු කරන පත්‍රිකා උපයෝගී කොට ගණන් කළ යුතුය.

12.2 ඡන්ද අපේක්ෂකයන් 9 දෙනෙකුට වැඩි ගණනක් සඳහා කැමැත්ත ලකුණු කර ඇති ඕනෑම ඡන්ද පත්‍රිකාවක් ප්‍රතික්ෂේප කිරීමට ඡන්ද නිලධාරි තැනට/කලාපභාර ඡන්ද නිලධාරි තැනට/සහකාර ඡන්ද නිලධාරි තැනට බලය ඇති වේ.

12.3 යම්කිසි ඡන්ද පත්‍රිකාවක ඡන්ද දායකයා ඡන්දය දී ඇත්තේ ඡන්ද අපේක්ෂකයින් දෙනෙකුගෙන් කවරෙකුට දැයි යන්න පැහැදිලිව දැනගත හැකි පරිදි නොවේ නම් ඒ ඡන්දය ප්‍රතික්ෂේප කර ඉතිරි ඡන්ද පිළිගැනීමට ඡන්ද නිලධාරි තැනට/කලාපභාර ඡන්ද නිලධාරි තැනට/සහකාර ඡන්ද නිලධාරි තැනට බලය ඇති වේ.

12.4 ඡන්දදායකයෙකු විසින් යම්කිසි ඡන්ද පත්‍රිකාවක ඡන්ද අපේක්ෂකයෙකුට කැමැත්ත දැක්වීම සඳහා ලකුණු එකකට වැඩි ගණනක් සඳහන් කර තිබුණත් ඒ සියල්ල එක ඡන්දයක් ලෙස සලකණු ලැබේ.

12.5 නියෝග මාලාවේ 12.2 සහ 12.3 යටතේ ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද පත්‍රිකා ගණන් කර ගොනු කර ඡන්ද පත්‍රිකා ගිණුම හා සමග තුලනය කළ යුතුය.

**ඡන්ද ප්‍රතිඵල**

13.1 ඡන්ද ගණන් කර අවසන් වූ විට, අනිකුත් අයට වඩා වැඩි ඡන්ද ගණනක් ලත් ඡන්දාපේක්ෂකයින් 9 දෙනා ප්‍රාදේශික කාරක සභිකයින් වශයෙන් තෝරා පත් වූ ලෙස පිළිගනු ලැබේ.

ඡන්දාපේක්ෂකයින් දෙදෙනෙකුට හෝ වැඩි ගණනකට එක සමාන ඡන්ද ගණනක් ලැබුණහොත්, ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි අවශ්‍ය අවස්ථාවලදී ඔවුන් අතුරෙන් කාරක සභාවට තෝරා පත් විය යුතු ඡන්දාපේක්ෂකයා හෝ ඡන්දාපේක්ෂකයින් කුසපත් ඇදීමෙන් තීරණය කල යුතුය. එහෙත් ඡන්දාපේක්ෂකයින් කිහිප දෙනෙකුට එක සමාන ඡන්ද ලැබුණත්, කාරක සභාවට අවශ්‍ය ඡන්දාපේක්ෂකයින් සංඛ්‍යාව නිශ්චිත වශයෙන් තෝරා පත් කර ගැනීමට හැකිනම් එසේ කුසපත් ඇදීම අවශ්‍ය නොවන්නේය.

13.2 ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි, කාරක සභාවට තෝරා පත් වූ ඡන්දාපේක්ෂකයින්ගේ නම් සඳහන් කරමින්, ඡන්ද විමසීමේ ප්‍රතිඵල සමිතියේ ලේකම් වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. එහි පිටපතක් ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි ප්‍රදේශයේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තැන වෙත ද යැවිය යුතුය.

13.3 එසේ තෝරා පත් වූ සාමාජිකයින්ගේ නම් සමිතියේ ලේකම් තැන විසින් ඒ ප්‍රාදේශිකයෙහි කාර්යාලයෙහි සහ ව්‍යාපාරික කටයුතු කරන ස්ථානයෙහි දින 10ක් තුළ ප්‍රකට ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

14.1 ඡන්ද විමසීම පැවැත්වීම සම්බන්ධයෙන් හෝ ඡන්ද ගණන් කිරීම සම්බන්ධයෙන් හෝ ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධයෙන් හෝ යම් කලහකාරී තත්ත්වයක් ඇතිවිය හැකි බව ඡන්ද නිලධාරිගේ මතය වන අවස්ථාවක ඒ පිළිබඳ කටයුතු කල්තැබීම පිළිබඳ තීරණය කිරීම හා ඒ සම්බන්ධයෙන් ඇතිවන ඕනෑම ප්‍රශ්නයක් පිළිබඳ ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරිතැනගේ තීරණය තීරණාත්මක හා අවසානාත්මක වන්නේය.

4 වන කොටස

**විවිධ කරුණු**

15.1 ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කළායින් පසු ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි විසින් -

(i) පාවිච්චි නොකරන ලද පත්‍රිකාද ලකුණු කරන ලද ඡන්දදායක ලැයිස්තුවද සියළුම නාම යෝජනා පත්‍රද නියෝග මාලාවේ 7.6 සහ 7.7 අනුව පිළියෙල කරන ලද ජර්නලයේ පිටපතක්ද කවරයක බහා සීල් තබා සමිතියේ ලේකම් වෙත භාරදිය යුතුය.

(ii) නරක්වූ ඡන්ද පත්‍රිකාද නියෝග මාලාවේ අංක 7.6 සහ 7.7 යටතේ පිළියෙල කරන ලද ජර්නලයේ මුල් පිටපතද සලකුණු කරන ලද නරක්වූ ඡන්ද පත්‍රිකාද වලංගු ඡන්ද පත්‍රිකාද කවරයක බහා සීල් තබා ප්‍රදේශයේ භාර සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයා වෙත යැවිය යුතුය.

16. සමිතියක ප්‍රාදේශීය කාරක සභාවේ සාමාජිකයින් තෝරාපත් කිරීම සම්බන්ධයෙන් ඇතිවන සියළුම වියදම් සමිතිය විසින් දැරිය යුතු වේ.

17. සියළු උපලේඛන ඇතුළුව මේ නියෝගවලට තවත් නියෝග ඇතුලත් කිරීමට හෝ සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ බලය කොමසාරිස්ට ඇති වන්නේය.

18. මේ නියෝගවල අර්ථ නිරූපණය සම්බන්ධයෙන් යම්කිසි ආරවුලක් ඇතිවුවහොත් ඒ සම්බන්ධයෙන් කොමසාරිස්තුමාගේ තීරණය අවසාන හා තීරණාත්මක තීරණය වන්නේය.

5 වන කොටස

**අර්ථ නිරූපණය**

19.1 මේ නියෝගවල 'අතුරු ව්‍යවස්ථා' යනු සමිතියේ එවකට බලපාන ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථාය. අතුරු ව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධනද ඊට ඇතුළත් වේ.

19.2 7(2)(අ) 17 සහ 18 නියෝගයන් හැර අන්‍ය නියෝගවල "කොමසාරිස්" යනු සමුපකාර සංවර්ධන කොමසාරිස්තුමා හෝ "සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු හෝ "සමුපකාර සංවර්ධන ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස්තුමා" හෝ "සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරයකු" හෝ ඉහත නම් සඳහන් කෙනෙකු විසින් නිසි පරිදි බලය පවරන ලද වෙනත් කෙනෙකු හෝ වන්නේය.

19.3 7(2) (අ) 17 සහ 18 වෙනි නියෝගයන්හි "කොමසාරිස් යනු" වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/ රෙජිස්ට්‍රාර්තුමා ය".

19.4 මෙම නියෝග මාලාව අනුව ඡන්ද නිලධාරි/කලාපභාර ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරි යනු, ඡන්දය පැවැත්වෙන ප්‍රාදේශික බල ප්‍රදේශය භාර සහකාර කොමසාරිස්වරයා විසින් ඡන්දය විමසීම සඳහා පත් කරනු ලබන පුද්ගලයින් වේ.

19.5 ඡන්ද දායකයා යනු, සමිතියක යම්කිසි ප්‍රාදේශික බල ප්‍රදේශයක සාමාජිකයෙකු වශයෙන් ප්‍රාදේශික කාරක සභාවක් පත් කර ගැනීම සඳහා සහතික කරන ලද ඡන්ද නාමලේඛනයේ නම සඳහන් පුද්ගලයෙකි.

19.6 සමුපකාර නීතිය යනු වයඹ පළාත තුළ තත් කාලයේ බල පවත්නා සමුපකාර සමිති පනත හෝ සමුපකාර සමිති ප්‍රඥාප්තිය.

20. මෙම නියෝගවල සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

*"අ" උපලේඛනය*

*සමුපකාර ප්‍රාදේශික කාරක සභාවක් තෝරා ගැනීමේ කටයුතු කිරීම සඳහා ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරීන් පත් කිරීමේ ලිපියක ආදර්ශ ආකෘතිය*

සී/ස ............................................................ විවිධ සේවා සමුපකාර සමිතියේ අතුරු ව්‍යවස්ථා මාලාවේ 23 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් පනවන ලද නියෝග මාලාවේ 3(1) නියෝගයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව හා අංක ............................................. දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් නිවේදනයට අනුව .................... අංක ...................... දරන සමුපකාර සමිති ......................... යටතේ ලියාපදිංචි කරන ලද හා ලදැයි සැලකිය හැකි හා 1970 අංක 35 (විශේෂ විධිවිධාන පනත) දරන පනත සමග කියවෙන පරිදි ඉහත කී සමිතියේ අංක ......................................... ප්‍රාදේශිකයට කාරක සභාවක් පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් නිලධාරී/කලාපභාර ඡන්ද නිලධාරී/සහකාර ඡන්ද නිලධාරී වශයෙන් .................................................................. මහතා/මිය/මෙනවිය මෙයින් පත් කරමි.

..........................................................
අත්සන.

..........................................................
නම,
සමුපකාර සංවර්ධන සහකාර කොමාසරිස්.

දිනය :........................................

*"ආ" උපලේඛනය*

***නාමයෝජනා පත්‍රය***

1. සමිතියේ නම සහ ලිපිනය :..............................
2. ප්‍රාදේශිකයේ අංකය හා ලිපිනය :..............................
3. ඡන්දාපේක්ෂකයාගේ, යෝජකගේ හා ස්ථිරකරුගේ විස්තර :..............................

| | *ඡන්දාපේක්ෂකයා* | *යෝජකයා* | *ස්ථිරකරු* |
|---|---|---|---|
| සම්පූර්ණ නම :<br>වයස :<br>ලිපිනය :<br>සාමාජික අංකය : | | | |

4. ඉහත නම් සඳහන් අප ප්‍රාදේශික කාරක සභා තෝරා පත්කර ගැනීමේ නියෝග මාලාවේ 4.1 යටතේ නුසුදුස්සන් නොවන බවත්, මෙම ප්‍රාදේශිකයේ සාමාජිකයින් වන බවත්, සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභා තෝරා පත් කිරීම පිළිබඳ නියෝග මාලාවේ 5.2 නියෝගය යටතේ අවශ්‍ය වන පරිදි ඡන්දාපේක්ෂකයාගේ ප්‍රකාශනය මීට අමුණා ඇති බවත් සහතික කරමු.

..................................................
ඡන්දාපේක්ෂකයාගේ අත්සන.

..................................................
යෝජකගේ අත්සන.

..................................................
ස්ථිරකරු අත්සන.

දිනය :................................

*"ඇ" උපලේඛනය*

*සමුපකාර සමිතිවල ප්‍රාදේශික කාරක සහා තෝරා පත් කර ගැනීමේ නියෝග මාලාවේ 5.2 නියෝගය යටතේ ප්‍රකාශය*

........................................................................ වන මම, සීමාසහිත ........................................................ සමුපකාර සමිතියේ අංක ........................................ දරන ප්‍රාදේශික කාරක සභාවට මා තෝරා පත් කිරීම සඳහා මාගේ නම යෝජනා කිරීමට මෙයින් කැමැත්ත දෙමි. තවද, අංක .......................................... හා ................................................ දින ගණන ගැසට් පත්‍රයෙහි ප්‍රකාශිත, සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත් කිරීම සඳහා සකස් කරන ලද නියෝග මාලාවේ 4.1 වෙනි නියෝගයේ සඳහන් නුසුදුසුකම් කිසිවකින් මා නුසුදුසු නොවන බව ද ප්‍රකාශ කරමි.

................................................
ඡන්දාපේක්ෂකයාගේ අත්සන.

දිනය :................................

*"ඇ1" උපලේඛනය*

*යෝජනාකරුගේ හා ස්ථිරකරුගේ ප්‍රකාශනය*

..................................................... වන මම, සීමාසහිත ................................................................. විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාජිකයෙක් බව සහතික කරන අතර උපලේඛන "ආ" සඳහන් මා විසින් අත්සන් තබා සහතික කරන ලද කරුණු මගේ දැනීමේ හැටියට සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි.

................................................
යෝජනාකරු/ස්ථිරකරු අත්සන.

...............................................
යෝජනාකරු/ස්ථිරකරුගේ නම.

දිනය :................................

*"ඈ" උපලේඛනය*

*සමුපකාර සමිතියක ප්‍රාදේශික කාරක සභාවක් තෝරා පත්කිරීම සඳහා ඡන්ද පත්‍රිකාව*

ඡන්ද නිලධාරි/සහකාර ඡන්ද නිලධාරිතැනගේ අත්සන .................................... අනුක්‍රමික අංකය :

ප්‍රාදේශිකගේ මුද්‍රාව :

| සංකේතය | කතිරය ගැසීමට | සංකේතය | කතිරය ගැසීමට | සංකේතය | කතිරය ගැසීමට | සංකේතය | කතිරය ගැසීමට |
|---|---|---|---|---|---|---|---|
| 1 | | 9 | | 17 | | 25 | |
| 2 | | 10 | | 18 | | 26 | |
| 3 | | 11 | | 19 | | 27 | |
| 4 | | 12 | | 20 | | 28 | |
| 5 | | 13 | | 21 | | 29 | |
| 6 | | 14 | | 22 | | 30 | |
| 7 | | 15 | | 23 | | 31 | |
| 8 | | 16 | | 24 | | 32 | |

04-148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.